# පාලි ආඛ්‍යාතයේ ස්වරූපකථනය

පහලගම ධම්මික හිමි
(බලගල්ල සරස්වතී මහ පිරිවෙනෙහි ආචාර්ය)

භාෂා ව්‍යාකරණයේ දී කිරීම්, වීම සම්ප්‍රකාශ වන්නේ ආඛ්‍යාත පදයෙනි. යම් වාක්‍යයක කර්තෘවරයා ප්‍රකාශ වන්නේ එකී ආඛ්‍යාත පදයෙනි. එය ආඛ්‍යාත පදය, ක්‍රියා පදය යනුවෙන් හඳුන්වනු ලබයි. ඉංග්‍රීසි භාෂාවෙන් Verb යනුවෙන් හඳුන්වයි. පාලි භාෂාවේ දී ආඛ්‍යාතය වාක්‍ය තුළ දී ආදි මධ්‍යාන්ත යන ස්ථානත්‍රයෙහි ම යෙදීම සුවිශේෂත්වයකි. ආඛ්‍යාතය සැකසෙනුයේ ධාතු ප්‍රකෘතියකට ධාතු ප්‍රත්‍යයක් එක්වීමෙනි. රාජ (දිත්තියං) රාජති (බබලයි) යනුවෙන් ආඛ්‍යාතයේ නිෂ්පත්තිය සිදුවෙයි. මෙසේ ආඛ්‍යාතප්‍රත්‍ය එක්වීමෙන් සැකසී ඇති ආඛ්‍යාත පද සාධනයෙහිලා ධාතු මහත් මෙහෙයක් සිදුකරනු ලබයි. ධාතු යන්න දැරීම් අර්ථයෙහි යෙදේ ධාතුව යනු ආඛ්‍යාත පදයට විශාල මෙහෙවරක් සිදුකරන අංගයකි. ධාතු ප්‍රකෘතිය හා ධාතු ප්‍රත්‍ය එක්වීමෙන් සැකසෙන්නා වූ ආඛ්‍යාත පදයෙහි ලක්ෂණ හයක් සුදීප්ත වෙයි.

"යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචි තිකාරකං
අත්ථි ලිංගං ද්විවචනං තදාඛ්‍යාතන්ති වුච්චති"[2]

ආඛ්‍යාතයේ ලක්ෂණකථනය නම් (තිකාලං) කාලතුනක් පැවතීමය. වර්තමාන කාල එනම් දැන්පවත්නා කාලයයි. භික්ඛු විහාරං ගච්ඡති. මෙහි දී ගච්ඡති යන ක්‍රියාවෙන් වර්තමාන ක්‍රියාර්ථයක් හඟවයි. එනම් මේ අවස්ථාවේ දී සිදුවීමකි. භික්ඛු විහාරං අගමි මෙහි අගමි යන ක්‍රියාවෙන් යම් ක්‍රියාවක් සිදුකොට අවසන් බව හැඟවෙයි. ඒහෙයින් එම ක්‍රියා අතීත කාලයට අයත් වෙයි. භික්ඛු විහාරං ගච්ඡිස්සති මෙම ක්‍රියාවෙන් කර අවසන් හෝ මේ මොහොතේ කරමින් පවත්නා බවක් නො හඟවන අතර කිරීමට බලාපොරොත්තු වීමක් පමණක් හඟවන හෙයින් අනාගත

කාලයට අයත් වෙයි. මෙකී භාෂා ව්‍යවහාර අනුව ආඛ්‍යාතයෙහි කාල තුනකි. තුන්කාලයක් ඉස්මතු වන හෙයින් ආඛ්‍යාතය තෛකාලික නම් වෙයි[3] පුරුෂ තුනකි. (තිපුරිසං) එනම් පඨම මජ්ඣිම හා උත්තම පුරුෂ වශයෙනි. ප්‍රථම පුරුෂයෙහි සියලු ම නාමයන් කර්තෘවරු වශයෙන් ඒකවචන හා බහුවචන ලෙසින් යෙදෙන අතර මධ්‍යම පුරුෂයෙහි ඒකවචන හා බහුවචන ලෙසින් ත්වං (නුඹ) තුම්හෙ (නුඹලා) කර්තෘවරුන් ලෙස යෙදෙයි. උත්තම පුරුෂයෙහි අහං (මම) මයං (අපි) යන කර්තෘවරු දෙදෙනා ඒකවචන හා බහුවචන වශයෙන් යෙදෙයි. ප්‍රථම පුරුෂ මධ්‍යම පුරුෂ හා උත්තම පුරුෂ යනුවෙන් ආඛ්‍යාතයෙහි පුරුෂත්‍රයකි[4] යම් කිසි සිදුවීමක් ක්‍රියාවක් ක්‍රියාවෙන් ප්‍රකාශ වන හෙයින් ක්‍රියාවාචී නම් වෙයි. (ක්‍රියා වාචී) අවසාන ක්‍රියාවෙන් කර්තෘ උත්ත වීම තුළින් ක්‍රියාර්ථය ප්‍රකාශ වෙයි. සො ගාමං ගච්ඡති යන වාක්‍යයෙහි ගච්ඡති යන අවසාන ක්‍රියාවේ (ගමු, සප්ප ගතිම්හිච) යෑම ප්‍රකාශ වෙයි. එම නිසා ආඛ්‍යාතය ක්‍රියා වාචී නම් වෙයි.[5] කාරකත්‍රයක් ආඛ්‍යාතයේ අන්තර්ගත වෙයි. කර්තෘ, කර්ම හා භාව කාරක යන කාරක තුනයි. ක්‍රියාවෙන් කර්තෘ උත්ත වී පඨමා විභත්‍යන්ත වන අතර කර්මය දුතියා විභත්‍යන්ත වෙයි. බුද්ධො ධම්මං දේසති බුද්ධො යන නාම පදය පඨමා විභක්ති ඒකවචන වන අතර කර්තෘ වශයෙන් වාක්‍යයෙහි පෙනී සිටියි. ධම්මං යන්න දුතියා විභත්‍යන්ත වෙයි.[6] කර්තෘ ආඛ්‍යාතයෙන් උත්ත වී ඇති වාක්‍ය කර්තෘ කාරක වෙයි. කර්ම කාරක වාක්‍යවල කර්ම උත්ත වී පඨමා විභත්‍යන්ත වන අතර කර්තෘ අනුත්ත වී තතියා විභත්‍යන්ත වෙයි. පුරිසෙන ඔදනො පච්චතෙ භාව කාරකයේ දී කර්තෘ කර්ම අපේක්ෂා නොකර සිදුවීම් අර්ථයක් පමණක් ප්‍රකාශ කරයි. දේවො වස්සතු කාරකත්‍රයක් ආඛ්‍යාතයේ දක්නට ඇත.[7] පාලි භාෂා ව්‍යවහාරයේ දී කර්තෘගේ ලිංගය ක්‍රියාව කෙරෙහි බලපෑම් නොකිරීම විශේෂත්වයකි. එනිසා ආඛ්‍යාතය අලිංගික වෙයි. (අලිංගිකං) පුරුෂ ලිංග වාක්‍යයේ දී පුරිසො ගාමං ගච්ඡති (පුරුෂයා ගමට යයි) ස්ත්‍රී ලිංග වාක්‍යයේ දී කඤ්ඤා ගාමං ගච්ඡති

(ස්ත්‍රිය ගමට යන්නීය) නපුංසක ලිංග වාක්‍යයේ දී සකටේන ගාමං ගච්ඡති (ගැලෙන් ගමට යයි) ගච්ඡති යන ආඛ්‍යාතය ලිංගත්‍රයේ අවිශේෂයෙන් යෙදීම පාලි භාෂාවේ සුවිශේෂත්වයකි. ඒ නිසා ආඛ්‍යාතය අලිංගික නම් වෙයි.[8] ආඛ්‍යාතය ඒකවචන හා බහුවචන වශයෙන් ද්විද වෙයි. (ද්විවචනං) එකස්වරූපය ඒකවචන වන අතර ඊට වඩා අධික වීම බහුවචනයයි. ගච්ඡති (යයි) ගච්ඡන්ති (යති) ඒ අනුව ආඛ්‍යාතය ද්විවචන වෙයි.[9] ඒ පාලි ආඛ්‍යාතයේ ලක්ෂණ හයක් දක්නට ලැබේ.

1. කාලත්‍රයක් නියෝජනය කිරීම.
2. පුරුෂත්‍රයක් නියෝජනය කිරීම.
3. ක්‍රියා වාචීවීම.
4. කාරකත්‍රයක් පැවැතීම.
5. අලිංගිකත්වය.
6. ද්විවචනයෙන් යුත්ත වීම.

මෙකී ෂඩාකාර වූ ලක්ෂණයන් රූපසිද්ධියේ දී ''තත්‍ථ ක්‍රියං ආචික්ඛතීති ආඛ්‍යාතං වුත්තං හි කාලකාරක පුරිසදීපකං ක්‍රියාලක්ඛණමාඛ්‍යාතන්ති තත්‍ථ කාලොති අතීතාදයො කාරකමිති කම්මකත්තභාවා පුරිසාති පඨමමජ්ඣිමුත්තමා ක්‍රියාති ගමනපචනාදිකො ධාත්වත්ථො ක්‍රියා ලක්ඛණං සඤ්ඤාණං එතස්සාති ක්‍රියා ලක්ඛණං අලිංගං ච වුත්තම්පි චේතං''[10] ආඛ්‍යාත වාක්‍යයේ යෙදීමේ දී ආකාර හතරක් ඔස්සේ ක්‍රියාත්මක වෙයි.

1. පුබ්බයෝගය.
2. පරයෝගය.
3. අන්තරායෝගය.
4. පකිණ්ණකයෝගය.

ආඛ්‍යාතය යම් වාක්‍යක මුලින්යෙදීම පුබ්බයෝගයයි. වාක්‍යයේ මුලින් සිටින ආඛ්‍යාතය අර්ථ කීපයක් සඳහා පෙනී සිටියි.

- නියෝගාර්ථය.
- පුච්ඡාර්ථය.
- ආමන්ත්‍රනාර්ථය.

යම් බඳු නියෝගයන් විධානයක් ප්‍රකට කිරීම සඳහා වාක්‍යයේ මුලින් සිටින ආඛ්‍යාතය පෙනී සිටියි. එය නියෝගාර්ථය නම් වෙයි. "ගච්ඡතු භික්ඛු විහාරං" ප්‍රශ්නයක් ඇසීම සඳහා වාක්‍යයක ආඛ්‍යාතය මුලින් යෙදීම පුච්ඡාර්ථය නම් වෙයි. "සන්ති තෙ එවරූපා ආබාධා" ඇමතීමක් සිදුකරන විට වාක්‍යයක ආඛ්‍යාතය මුලින් යෙදීම ආමන්ත්‍රනාර්ථයයි. "එහි භික්ඛු භගවා අවොච" වාක්‍යයක අවසානයේ ආඛ්‍යාතය යෙදීම පරයෝගයයි. එහි අර්ථ දෙකකි.

- ආයාචනය.
- පකාසනය.

යමක් ඇයදීම සිදුවෙයි නම් එය ආයාචනයයි. "ඉධ භික්ඛවෙ ආගච්ඡතු" යමක් ප්‍රකාශ කිරීමේ දී ආඛ්‍යාතය වාක්‍යයේ අගට යොදනු ලබයි. "එවමෙතං ධාරයාමි" අන්තරායෝගය නම් ආඛ්‍යාතය වාක්‍යයේ මධ්‍යයෙහි යෙදීමයි. එහි අර්ථ දෙකකි.

- නිර්දේශය.
- පෙර වූ දෙයක් පැවසීම.

යමක් නිර්දේශ වශයෙන් දක්වන අවස්ථාවේ දී වාක්‍යයේ මධ්‍යයෙහි ආඛ්‍යාතය යොදයි. "යස්මිං සමයේ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති සොමනස්ස සහගතං ඤාණසම්පයුත්ත" පෙර සංසිද්ධියක් පවසන විට වාක්‍යයෙහි අවසානයේ ආඛ්‍යාතය යොදයි. "තෙන ඛො පන සමයෙන

බුද්ධො භගවා උරුවේලායං විහරති නජ්ජා නෙරඤ්ජරාය තීරෙ" පකිණ්ණක යෝගය නම් ආඛ්‍යාත කීපයක් මිශ්‍රව වාක්‍යයේ යෙදීමයි. එය දෙයංශයක් නියෝජනය කරමින් යෙදෙයි.

- උපමා විෂයෙහි.
- ගාථා විෂයෙහි.

උපමාකථනයෙහි දී මෙකී ලක්ෂණය ප්‍රකටව පෙනේ. "සෙය්‍යථාපි භික්කවෙ පුරිසො ආගච්ඡෙය්‍ය ආදිත්තං තිණුක්කං ආදාය සො එවං වදෙය්‍ය අහං ඉමාය ආදිත්තාය තිණුක්කාය ගංගං නදිං සන්තාපෙස්සාමි සම්පරිතාපෙස්සාමි"[11] ගාථාවල දී ආඛ්‍යාතය මුල මැද අග යන ස්ථානවල දී අඛ්‍යාතය යෙදෙයි.

"දිවා තපති ආදිච්චො
රත්තිං අභාති චන්දිමා,
සන්නද්ධො ඛත්තියො ථපති
ඣායි ථපති බ්‍රාහ්මණො
අථ සබ්බමහොරත්තිං
බුද්ධො ථපති තෙජසා"[12]

මෙහි දී ථපති, අභාති යන ආඛ්‍යාත විවිධ ස්ථානවල යොදා ඇත.

ධාතු ගණ හා විකරණ

ධාතු නම් ආඛ්‍යාතයක් බවට පරිවර්තනය වීමට පෙර ස්වරූපයයි. එනම් ධාතු ප්‍රකෘති තත්ත්වයයි. ධාතු යනු ස්වකීය ස්ථාන දැරීමයි[13] පච, ගමු, රුද ආදී ධාතු ප්‍රත්‍ය නොගැන් වූ ස්වරූපය ධාතු නම් වෙයි. ඒ ඒ ධාතු භජනය කරන ගණ හෙවත් කොට්ඨාශ කච්චායන සම්ප්‍රදායෙහි හතක් දක්වයි. මහාසද්දනීතිප්පකරණයේ දී ධාතු ගණ අටක් නිර්දේශ කරනු

ලබයි. (ඉමස්මිං භගවතො පාවචනෙ අට්ඨවිධා ධාතු ගණා භවන්ති) කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායානුකූලව ධාතු ගණ හත නම්,

1. භවාදි ධාතු ගණය.
2. රුධාදි ධාතු ගණය.
3. දිවාදි ධාතු ගණය.
4. ස්වාදි ධාතු ගණය.
5. කියාදි ධාතු ගණය.
6. තනාදි ධාතු ගණය.
7. චුරාදි ධාතු ගණය. [14]

විකරණ වශයෙන් හඳුන්වන්නේ ධාතු ප්‍රකෘතියත් ආඛ්‍යාත ප්‍රත්‍යයත් නිසියාකාරව සම්බන්ධ කිරීම සඳහා උපකාරක වන පදයයි. විකරණ බෙහෙවින් ආඛ්‍යාතය පදය සැකසීමට බලපානු ලබයි. ධාතු ගණ තරමට ම විකරණ ප්‍රත්‍ය තිබේ. විකරණය ධාතු ප්‍රකෘතියට හා ආඛ්‍යාත විභක්ති ප්‍රත්‍ය අතරට පැමිණි ආඛ්‍යාත පදයක් නිර්මාණයට දායක වී ලුප්තප්‍රායව සිටී. එමෙන් ම ධාතු ගණවලට බෙදීම කෙරේද විකරණ ප්‍රධානත්වයක් ගනී.

1. සද්දනීති (=සනි) 02 පිටුව, අරුග්ගොඩ සීලානන්ද හිමි (සංස්කරණ) 1909. තත්ථ ධාතුති කෙනට්ඨේන ධාතු සකත්ථම්පි ධාරේතීති ධාතු
2. සනි, 08 පිටුව, මහාරූප සිද්ධි 181 පිටුව, ධම්මකිත්තිසිරිධම්මාරාම තිස්ස හිමි (සංස්) විද්‍යාසාගර මුද්‍රණාලය. 1915. තත්ථ ක්‍රියං ආචික්ඛතීති ආඛ්‍යාතං ක්‍රියා පදං වුත්තං හි කාරක පුරිසදීපකං ක්‍රියාලක්ඛණමාඛ්‍යාතන්ති තත්ථ කාලොති අතීතාදයෝ කාරකමිති කම්මකත්තුභාවා පුරිසාති පඨමජ්ඣිමුත්තමා ක්‍රියාති ගමනපචනාදිතො ධාත්වත්ථො සඞ්ඛ්‍යාණං එතස්සාති ක්‍රියාලක්ඛණං අලිංගං ච වුත්තම්පි චෙතං. සද්දසාරත්ථජාලිනීය 154 පිටුව, සීලාන්නද හිමි (සංස්) විදී්‍යාසාගර මුද්‍රණාලය. 1902. බාලාවතාරය. 74 පිටුව. කළුවච්චිමුල්ලේ මහානාම හිමි.
3. සද්දසාරත්ථජාලිනී, 154 පිටුව.
4. එම, තයො පුරිසා අස්සාති තිපුරිසං.
5. එම, ක්‍රියා වදතීති ක්‍රියාවාචී.

6. බාලාවතාරය, කම්මතො දුතියා.
7. සද්දසාරත්ථජාලිනී, 154 පිටුව. තීණි කාරකා අස්සාති තිකාරකං.
8. එම, නත්ථි ලිංගං අස්සාති අලිංගිකං.
9. එම, ද්විවචනෙහි යුත්තං ද්විවචනං.
10 රූපසිද්ධි, 181 පිටුව.
11. මජ්ඣිම නිකාය I, 320 පිටුව.
12. ඛුද්දක නිකාය I, 120 පිටුව.
13. තත්ථ ධාතූති කෙනට්ඨෙන ධාතු සකම්පි ධාරෙති ධාතු අත්ථාතිසයසංයොගතො පරත්ථම් ධාරෙති. සනි, 12 පිටුව.
14. භවාදි ච රුධාදි ච දිවාදි ස්වාදයො ගණා කියාදිච ච තනාදි ච චුරාදි ච සත්තධා. කච්චායනය,